(අන්තර්ජාල අනුවාදය)

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

## 1999 අංක 14 දරන ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1999 ජුනි මස 15 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1999 ජුනි මස 18 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 4.50 තැපැල් ගාස්තුව: රු.3.50

1999 අංක 14 දරන ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1999 ජුනි මස 15 වන දින.]

එල්.ඩී. - ඕ. 24/95.

## 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ පනත 1999 අංක 14 දරන ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති පිළිවෙලින් ඒ පනතේ 9අ සහ 9ආ වගන්ති ලෙස බලපැවැත්විය යුතු ය:- 1987 අංක 15 දරන පනතේ 9අ සහ 9ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

"ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ සීමාවන් වෙනස් කිරීමට ද සභිකයන් සංඛ්‍යාව වෙනස් කිරීමට ද ප්‍රාදේශීය සභාව විසුරුවා හැරීමට සහ ප්‍රතියෝජනය කිරීමට ද අමාත්‍යවරයාට ඇති බලය.

9 අ. ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් ඕනෑම අවස්ථාවක දී -

(අ) 2 වන වගන්තියේ විධිවිධානවලට අනුකූල වන ආකාරයකින් යම් ප්‍රාදේශීය සභා ප්‍රදේශයක සීමාවන් වෙනස් කිරීම;

(ආ) 4 වන වගන්තියේ දක්වා ඇති ප්‍රතිපත්තිවලට අනුකූලව, යම් ප්‍රාදේශීය සභාවක් සඳහා 4 වන වගන්තිය යටතේ තීරණය කරනු ලබන සභිකයන්ගේ සංඛ්‍යාව වෙනස් කිරීම;

(ඇ) දැනට පවත්නා යම් ප්‍රාදේශීය සභාවක් විසුරුවා හැර, පවත්නා ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කරන ලද්දේ යම් ප්‍රාදේශීය සභා සීමා සඳහා ද ඒ ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ සීමාවල යම් වෙනස් කිරීමක් මත, ඒ පවත්නා ප්‍රාදේශීය සභාව වෙනුවට, නව ප්‍රාදේශීය සභාවක් සංස්ථාපනය කිරීම යෝග්‍ය යයි අමාත්‍යවරයාට පෙනී යන කවර විටක වුවද, නව ප්‍රාදේශීය සභාවක් මගින් ඒ ප්‍රාදේශීය සභාව පුනස්ථාපනය කළ යුතු යයි විධාන කරනු ලැබිය හැකිය;

(ඇ) යම් ප්‍රාදේශීය සභාවක් වෙනුවට මහ නගර සභාවක් හෝ නගර සභාවක් ස්ථාපනය කිරීමේ කාර්ය සඳහා ඒ ප්‍රාදේශීය සභාව විසුරුවා හැරීම. මහ නගර සභාවක් ස්ථාපනය කිරීමේ දී අමාත්‍යවරයා විසින්, මහ නගර සභා ආඥාපනතේ 2 වන වගන්තියේ විධිවිධාන ඉටු කරනු ලැබිය යුතු අතර, ඒ මහ නගර සභාව ස්ථාපනය කරනු ලබන්නේ කවර ප්‍රදේශයක් සඳහා ද ඒ ප්‍රදේශයේ සංවර්ධනය හෝ පහසුකම් සැලකිල්ලට ගැනීම ද කළ යුතුය; එසේම නගර සභාවක් ස්ථාපනය කිරීමේ දී අමාත්‍යවරයා විසින් නගර සභා ආඥාපනතේ 2 වන වගන්තියේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු ය;

එසේ වුවද, මේ වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් කරන ලද කිසිදු නියමයක්, ඒ නියමයේ සඳහන් දැනට පවත්නා යම් ප්‍රාදේශීය සභාවක සභිකයන්ගේ ධුර කාලය ඉකුත්ව යන තෙක් බලාත්මක නොවිය යුතු ය.

නව ප්‍රාදේශීය සභාව දැනට පවත්නා ප්‍රාදේශීය සභාවේ අනුප්‍රාප්තිකයා විය යුතු බව.

9 ආ. විසුරුවා හරිණු ලැබූ යම් සභාවක් වෙනුවට 9අ වගන්තිය යටතේ යම් නව ප්‍රාදේශීය සභාවක් සංයුක්ත කරනු ලැබූ අවස්ථාවක දී -

(අ) නව සභාව සංයුක්ත කරනු ලැබූ ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමාවලට, විසුරුවා හරින ලද සභාව සංයුක්ත කරනු ලැබූ ප්‍රාදේශීය සභා ප්‍රදේශය හෝ ඉන් කොටසක් ඇතුළත් වන තාක් දුරට, ඒ ප්‍රදේශයට හෝ එහි කොටසට අදාළ සියලු කාර්ය සඳහා නව සභාව, එය සංයුක්ත කළ දිනයේ සිට, විසුරුවා හරින ලද සභාවේ අනුප්‍රාප්තිකයා විය යුතු ය;

(ආ) නව සභාවේ පරිපාලන සීමා තුළ පිහිටි, විසුරුවා හරිණු ලැබූ සභාවේ සියලු දේපළ ද, ඒ විසුරුවා හරින ලද සභාවේ සියලු

අයිතිවාසිකම්, බලතල, කාර්ය, ණය, බැරකම් හා වගකීම්, නව සභාවේ පරිපාලන සීමා ඇතුළත යම් ප්‍රදේශයකට අදාළ වන තාක් දුරට නව සභාව සංයුක්ත කරනු ලැබූ දින සිට ඒ නව සභාව වෙත පවරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතුය;

(ඇ) යම් ප්‍රඥප්තියක හෝ එය යටතේ සාදන ලද යම් නියමයක, රීතියක, නියෝගයක හෝ අතුරු ව්‍යවස්ථාවක හෝ ඒ ප්‍රඥප්තිය ප්‍රකාරව ලියා අත්සන් කරන ලද හෝ නිකුත් කරන ලද ලේඛනයක හෝ සාධන පත්‍රයක එවැනි විසුරුවා හරින ලද සභාවක් සම්බන්ධයෙන් කරන ලද සියලු සඳහන් කිරීම, නව ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමාවලට ඇතුළත් කරනු ලැබිය යුතු විසුරුවා හරිනු ලැබූ ඒ සභාවේ පරිපාලන සීමාවලට අයත් යම් ප්‍රදේශයක කාර්යය සඳහා, නව සභාවට කරන ලද සඳහන් කිරීම් වූවාක් මෙන් තේරුම් ගත යුතු ය.”

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු.870 කි. (විදේශීය) රු.1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.